**ශීර්ෂය 221 – කම්කරු දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 221 - කම්කරු දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කම්කරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 ජුනි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කම්කරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී

සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සඳහා අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) දේපල පිරියත හා උපකරණ**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මූල්‍ය නොවන වත්කම්වල ඇතුලත් අයිතම් 05 ක භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල ආරම්භක ශේෂ 2021 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මුද්‍රිත සමඟ සැසඳීමේදී රු.18,643,128ක වෙනසක් නිරීක්ෂණය විය. | 2022 නොවැම්බර් 30 දිනට භාණ්ඩාගාර මුද්‍රිත සටහන් වල පවතින අවසාන ශේෂය 2022 දෙසැම්බර් මස භාණ්ඩාගාර මුද්‍රිත සටහන් වල ආරම්භක ශේෂය සමඟ වෙනස්කම් හඳුනා ගැනීමට හැකි විය. එම දෝෂ පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් විමසීම් කිරීමේදී භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල වෙනස්කම් සිදු වී ඇති බව හඳුනා ගැනීමට හැකි විය. එය පරීක්ෂා කිරීමෙන් පසු ඉදිරියේදී භාණ්ඩාගාර මුද්‍රිත සටහන් මඟින් නිවැරැදි කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ශේෂයන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**(ආ) බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දින භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශය (SA-92) අනුව බැරකම් ශේෂය රු.18,811,256ක් වූ අතර එදිනට ගිණුම් ප්‍රකාශවල දක්වා තිබූ බැරකම් ශේෂය රු.23,180,626 ක් විය. | කම්කරු දෙපාර්තමේන්තුවේ මුළු අංශ 101කින් සමන්විත වේ. මෙම සියලුම අංශ වෙතින් බැරකම් ලෙස හඳුනා ගෙන වාර්තා කිරීමේදී ප්‍රායෝගික අපහසුතා රාශියක් පැන නැගී ඇත. කෙසේ වෙතත් නිවැරදි බැරකම් හඳුනා ගෙන වාර්තා කිරීමට සියලු පාර්ශවයන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | සියළුම බැරකම් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූලධන වැය විෂයන් අතර රු.36,952,781ක ප්‍රතිපාදන මාරු කිරීමේදී මුදල් රෙගුලාසි 66 (4)(අ) වගන්තිය ප්‍රකාරව අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | වෙනත් වැය විෂයන් වෙත ප්‍රතිපාදන මාරු කිරීමක් සිදු කර නොමැති අතර සේ.අ. අරමුදලට අදාලව පිළියෙළ කරනු ලබන අවසන් ගිණුම පිළියෙළ කිරීමේදී ක්ෂය කිරීමේ අවශ්‍යතාවය මත පමණක් ඉහත වැය විෂයන් යටතේ මිලදී ගත් ලීබඩු හා කාර්යාල උපකරණ, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අදාල ස්ථාවර වත්කම් කාණ්ඩ යටතේ හඳුනා ගැනීම පමණක් සිදු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ආ) | 2022 අප්‍රේල් 26 දිනැති රාජ්‍ය අයවැය චක්‍රලේඛ අංක 03/2022 හි 03 (xvii) ප්‍රකාරව ප්‍රතිපාදනවල ඉතිරිවීම් සම්බන්ධව කටයුතු කලයුතු වුවද, 2022 වර්ෂය සඳහා මූලධන වැය විෂයය 03 කට වෙන් කරන ලද ප්‍රතිපාදන, වෙනත් මූලධන වැය විෂයයන් සඳහා වියදම් කර තිබුණි. එලෙස ප්‍රතිපාදන මාරු කරන ලද වැය විෂයයන් සඳහා රු.5,579,872 ක ප්‍රතිපාදන යථෝක්ත චක්‍රලේඛය නිකුත් කිරීමෙන් පසුව වියදම් කර තිබුණි. | රාජ්‍ය අයවැය චක්‍රලේඛ 03/2022 උල්ලංඝනය වන පරිදි කටයුතු කර නොමැත. | අයවැය චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | නිරීක්ෂණය<br>වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | 1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥා පනත | | | | |
| (i) | 34 (6) වගන්තිය | | වාෂ්ප බොයිලේරුවක් යටත් පිරිසෙයින් සෑම මාස 14 කට වරක් පරීක්ෂා කල යුතු අතර, බරපතල අළුත්වැඩියාවකින් පසුව බලයලත් නිලධාරියෙකු පරීක්ෂා කර අත්හදා බැලිය යුතුය. මෙම අවශ්‍යතාවය මත සෑම බොයිලේරුවක් සම්බන්ධවම සිදුවන බවට සෑහීමට පත්වීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුවේ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය විසින් සකස් කර නොතිබුණි. | බලයලත් නිලධාරීන් මගින් පරීක්ෂා කර ඉදිරිපත් කරනු ලබන වාර්තාවල පිටපත් දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල වෙත කර්මාන්තශාලා හිමියන් සහ බලයලත් නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අතර ඒ අනුව දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛන දැනටමත් පවත්වාගෙන යනු ලබයි. | පනත ප්‍රකාරව බොයිලේරු පරීක්ෂාවන් නිසි පරිදි සිදුකල යුතුය |
| (ii) | 92 වගන්තිය | | කර්මාන්තශාලාවේ සිදුවන හදිසි අනතුරු සහ කාර්මික රෝග සම්බන්ධ විස්තර සාමාන්‍ය ලේඛණයේ සඳහන් කර එහි පිටපත් දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය වෙත එවිය යුතු වුවද එවැනි තොරතුරු දත්ත ලබාගැනීමේ ක්‍රමවේදයක් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලයේ නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ යෝජිත ඩිජිටල්කරණ සැලසුම අනුව මෙම කටයුතු තවත් විධිමත් කර ගැනීමට පියවර ගැනීමට අපේක්ෂිතව ඇත. | කර්මාන්තශාලාවල හදිසි අනතුරු හා කාර්මික රෝග පිළිබඳ විධිමත් වාර්තා පවත්වා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | කම්කරු කොමසාරිස් ජනරාල්ගේ 1999 පෙබරවාරි 11 දිනැති අංක 01/99 දරණ | | සේවක අර්ථසාධක අරමුදලේ හිඟ දායක මුදල් හා අධිභාර මුදල් අයකර ගැනීමේදී මුල් පරීක්ෂණ අවස්ථාවේ නිවැරදි | කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කම්කරු කාර්යාල හා උප කම්කරු කාර්යාල 57 ක් මගින් චක්‍රලේඛ | හිඟ දායක මුදල් හා අධිභාර පිළිබඳව විධිමත් හා නිවැරදි තොරතුරු පවත්වා ගැනීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| චක්‍රලේඛයේ 1.1, 1.1(3), 5.2 වගන්ති | තොරතුරු රැස්කර ගැනීම, සේවක ප්‍රකාශන ලබා ගැනීම, විධිමත් පරීක්ෂණ වාර්තා පවත්වාගෙන යාම, අධිභාර නිවැරදිව ගණනය කිරීම, සේ.අ.අ/නී.ක්‍රි/ 05 දරණ ලේඛණය පවත්වාගෙන යාම චක්‍රලේඛ ප්‍රකාරව සිදුකර නොතිබුණි. | ප්‍රකාරව කටයුතු කර නොමැති බවට කරුණු ඉදිරිපත් වී නොමැති බැවින්, ඒ සම්බන්ධයෙන් එකඟ වීම හෝ නොවීම පිළිබඳව අදහස් ප්‍රකාශ කළ නොහැකි බව කාරුණිකව සඳහන් කරමි. | කල යුතුය. |
| (ඇ) 2019 සැප්තැම්බර් 27 අංක 2142/90 ගැසට්පත්‍රය | i. ගැසට් නිවේදනයේ විධිවිධාන ප්‍රකාරව හුමාල බොයිලේරු සහ වෙනත් පීඩන භාජන ලියාපදිංචි කිරීමේ විධිවිධාන සැලැස්විය යුතු වුවත්, කර්මාන්තශාලා පරීක්ෂාවේදී වෙනත් පීඩන භාජන, පරීක්ෂා කිරීමේ විධිවිධාන ඇතුලත් කර නොතිබුණි. | අනෙකුත් පීඩන භාජන ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන මෙම රෙගුලාසි මඟින් පනවා නොමැත. | ගැසට් නිවේදනයේ නියෝග ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| | ii. සේවකයන් අධික ශබ්දයෙන් ආරක්ෂා කිරීමේ ක්‍රමවේදයන් ඇති බවටත්, කර්මාන්තශාලාවේ ප්‍රමාණවත් ආලෝක සැපයුමක් ඇති බවටත් තහවුරු කල යුතු වුවද, කර්මාන්තශාලා පරීක්ෂාවේදී භාවිත කරනු ලබන නිරීක්ෂණ ලැයිස්තු එම පරීක්ෂා කිරීම් සටහන් කිරීමට අවශ්‍ය පරිදි නව ගැසට් පත්‍රයේ නියෝගවලට අනුකූල වන පරිදි යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | පාරිසරික දත්තයන් වන ආලෝකය හා ශබ්දය පිළිබඳ මිනුම් කටයුතු කිරීම දෙපාර්තමේන්තුවේ වෘත්තීය ස්වස්ථතා අංශයේ පරීක්ෂණ නිලධාරීන් මඟින් සිදුකරනු ලබන අතර දෙපාර්තමේන්තුවේ මිනුම් කටයුතු සඳහා ඇති උපකරණ හා මානව සම්පත් වල ප්‍රමාණය අනුව එම පරීක්ෂා කිරීම් අදාල නිර්දේශ අවශ්‍ය අවස්ථාවලදී වෘත්තීය ස්වස්ථතා අංශයෙන් ලබාගනු ලබයි. | ගැසට් නිවේදනයේ නියෝග ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2.3 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කම්කරු දෙපාර්තමේන්තුවට අයත් රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු කඩිනමින් ඉටුකරවා ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3 පරිච්ඡේදයේ පරිදි ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කිරීමකින් තොරව රු.11,177,000ක් වූ ප්‍රසම්පාදනය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත භාරදී තිබුණි. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් මෙම කොන්ත්‍රාත්තුව රු.9,590,303ක වටිනාකමකට පෞද්ගලික කොන්ත්‍රාත් ආයතනයකට උපකොන්ත්‍රාත් පිරිනමා තිබුණි. ඇස්තමේන්තු වටිනාකම තුල වූ කළමණාකරණ ගාස්තුව රු.449,960ක් වූ නමුත් ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු නිසි පරිදි අධීක්ෂණය වී නොමැති අතර, වරින් වර පෙන්වා දෙන ලද අඩුපාඩු කොන්ත්‍රාත්කරු විසින් සකස් කර දී නොතිබුණි. | ව්‍යාපෘතියට අදාළ සම්පූර්ණ ඇස්තමේන්තු මුදල ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත නිදහස් කළ ද ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ඉදිකිරීම් කටයුතු අවසන් වූ පසු ඉතිරි ප්‍රතිපාදන නැවත කම්කරු දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ.<br>ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ දී නිම නොවූ කොටස් තිබේ නම් එම කොටස් අදාළ කොන්ත්‍රාත් ආයතනය මගින්ම සිදු කරවා ගැනීමට හෝ එසේ නොවන්නේ නම් මෙම අළුත්වැඩියාවට අදාළ රඳවුම් මුදල් භාවිතා කරමින් එම කටයුතු ඉටු කර ගැනීමට කටයුතු කරන ලෙස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත. රඳවුම් මුදල් ප්‍රමාණවත් නොවන්නේ නම් අදාළ කොන්ත්‍රාත් ආයතනයේ අවසාන බිල්පත ගෙවීමේ දී ඒ පිළිබඳව අවදානය යොමු කර කටයුතු කරන ලෙස ද ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2.4 තැන්පත් ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන පොදු තැන්පත් ගිණුම් 02 ක 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.767,737,985 ක් වූ අතර එම ශේෂය රු.175,653,978 ක් අවුරුදු 02 ට වඩා කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි | 2022 දෙසැම්බර් 31 දිනට ශේෂයෙන් 2023 අප්‍රේල් 30 දිනට එම ගිණුම් වල ශේෂ පිළිවෙලින් රු.131,794,490 හා රු.547,358,262 ක් වේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 571 (2) හා (3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ කම්කරු දෙපාර්තමේන්තුවට හා දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල සේවක අර්ථ සාධක අරමුදලට අදාලව එකතුව රු.282,726,669ක් අදාල කේවල ගිණුම් වලට බැර කිරීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | සමාලෝචිත වර්ෂයේ කම්කරු දෙපාර්තමේන්තුවේ හා දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල සේවක අර්ථසාධක අරමුදල් අංශයට අදාලව මේ වන විට (2023 අප්‍රේල් 30) එකතුව රු.199,233,655.63 ක් වේ. | දායක මුදල් කේවල ගිණුම්වලට බැරකිරීමට කටයුතු කල යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කර්මාන්තශාලා අයිතිකරු හෝ පදිංචිකරු වීම සඳහා 2019 සැප්තැම්බර් 27 දිනැති අංක 2142/90 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ විධිවිධානවලට අනුව ලියාපදිංචි විය යුතු වුවත්, 2022 වර්ෂය අවසාන වන විට දිස්ත්‍රික් කර්මාන්තශාලා ඉංජිනේරු කාර්යාලය තුල පවත්වාගෙන ගිය ගොනු සංඛ්‍යාව 32,948 කින් නව නීතිරීති අනුව ලියාපදිංචි වූ සංඛ්‍යාව 3,153 ක් විය. අවම ලියාපදිංචි ගාස්තුව වූ රු.1,000 සැලකූවිට ලියාපදිංචි නොවූ කර්මාන්තශාලා සඳහා ලබාගත හැකි ලියාපදිංචි ගාස්තුව අවම වශයෙන් රු.29,795,000ක් දෙපාර්තමේන්තුවට අහිමි වී තිබුණි. | ඉංජිනේරු සංඛ්‍යාව ප්‍රමාණවත් නොවන බැවින් කර්මාන්තශාලා වෙත ගොස් ලියාපදිංචි කටයුතු කිරීම ඉතා අපහසු වී ඇත. එමෙන්ම පසුගිය වසරවල මුහුණපෑමට සිදුවූ කොවිඩ් වසංගතය, ආර්ථික ගැටළු හා ඉන්ධන අර්බුදය වැනි ගැටළුද මේ සඳහා බලපෑම් එල්ලකල බව දන්වා සිටිමි. කෙසේ නමුත් දෙපාර්තමේන්තුව විසින් මෙම කටයුතු වැඩිකර ගැනීම සඳහා පියවරයන් ගෙන ඇත. | ගැසට් පත්‍රයේ විධිවිධානවලට අනුකූලව කර්මාන්තශාලා ලියාපදිංචි කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | කර්මාන්ත ශාලා ආඥා පනතේ විධිවිධානවලට අනුව කටයුතු නොකිරීම හේතුවෙන් නඩු පැවරීමට 2010–2018 කාල සීමාව තුල ගොනු 52 ක් ලැබී තිබුණු නමුත් ඉන් නඩු පැවරීම සිදුකර තිබුණේ ගොනු 11 ක් සම්බන්ධයෙන් පමණි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිද්ධීන් 09 ක් | පසුගිය වසරවල පැවති කොවිඩ් වසංගතය, ආර්ථික අර්බුදය හා ඉන්ධන හිඟය හේතුවෙන් ප්‍රතිපාදන සීමා කිරීම, කාර්යාල හා අධිකරණ කටයුතු අඛණ්ඩව සිදුනොවීම වැනි කරුණු හේතුවෙන් නඩු කටයුතු සම්බන්ධව ප්‍රමාදයක් සිදුවී ඇති අතර කාර්යාල කටයුතු යථාතත්වයට පත්වීමත් සමඟ | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| සම්බන්ධයෙන් නඩු පැවරීමට කර්මාන්ත සුරක්ෂිතතා අංශය විසින් අනුමැතිය ලබා දී මාස 05 සිට වසර 02 ක් ඉක්මවා තිබුණද මෙම වාර්තාවේ දින වන විටත් නඩු පැවරීමට කටයුතු කර නොතිබුණි. | අවම ප්‍රතිපාදනයන් තුල සැලසුම් සහගතව කටයුතු කරමින් නඩු පැවරීමේ කටයුතු වේගවත් කිරීමට සැලසුම් කර ඇත. | |
| (ඈ) <u>පෞද්ගලික අර්ථසාධක අරමුදල් අධීක්ෂණය</u> | | |
| (i) 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ 27 වගන්තිය ප්‍රකාරව අනුමත කරන ලද අර්ථසාධක අරමුදල් හා අනුමත කරන ලද දායක විශ්‍රාම වැටුප් ක්‍රම පරිපාලනය සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන ලබාදී තිබුණු අතර මෙම අරමුදල විධිමත්ව පරිපාලනය සහ අධීක්ෂණය සඳහා කම්කරු දෙපාර්තමේන්තුව පුද්ගලික අර්ථසාධක අරමුදල් අංශයක් පිහිටුවා තිබුණි. දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පෞද්ගලික සේවක අර්ථසාධක අරමුදල් (PPF) 117 කින් ආයතන 87 ක පමණක් ශේෂයන් හඳුනාගෙන තිබුණි. අරමුදල්වල ශේෂයන් ඉදිරිපත් නොකල ආයතනවල තොරතුරු පවත්වාගෙන ගොස් නොතිබුණු අතර, මෙම අරමුදල් සම්බන්ධ නිසි අධීක්ෂණයක් සිදු වී නොතිබුණි. | 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ 27 වන වගන්තිය ප්‍රකාරව අනුමත අර්ථසාධක අරමුදල් ක්‍රියාත්මක වන සක්‍රිය ආයතන 117 ක් අතරින් දැනට ශේෂයන් ඉදිරිපත් කර නොමැති ආයතන සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේ කටයුතු, පවතින නිලධාරී හිඟය හා රජයේ වියදම් සීමා කිරීමේ ප්‍රතිපත්තිය යන කරුණු මත සිදු කරමින් පවතින අතර 2023 වර්ෂය අවසානය වන විට එම කටයුතු සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමි. තව ද එම අරමුදල්වල ශේෂයන් නිරන්තරයෙන් වෙනස් වීමට භාජනය වන බව ද වැඩිදුරටත් සඳහන් කරමි. | පෞද්ගලික අර්ථසාධක අරමුදල් අධීක්ෂණය කඩිනම් කල යුතුය. |
| (ii) මෙම අරමුදල සම්බන්ධයෙන් 2017 වර්ෂයේ සිට 2021 දක්වා පැමිණිලි 291 ක් ඉදිරිපත්ව තිබූ අතර, මෙයින් පැමිණිලි 68 ක් විසඳා නොතිබුණි. | 2017,2018 හා 2019 වර්ෂයන්හි දී පුද්ගලික අර්ථසාධක අරමුදල් අංශයට අනුයුක්තව එක් කළමනාකරණ සේවා නිලධාරිනියක් පමණක් සේවය කරන ලද අතර ඒ අනුව රාජකාරි බහුලතාවය මත පෙත්සම් ලේඛනයේ යාවත්කාලීන කිරීමේ අඩුපාඩු සිදුව ඇත. එසේ වුව ද එම පැමිණිලි පරීක්ෂණ කටයුතු විවිධ පරීක්ෂණ අධියරයන් යටතේ ක්‍රියාත්මකව පවතින බව ද වැඩිදුරටත් සඳහන් කරමි. | පැමිණිලි පිළිබඳ විධිමත් පරීක්ෂාවක් කල යුතුය. |

| | | |
|---|---|---|
| (iii) පනතේ 27(2)(අ) වගන්තිය ප්‍රකාරව යම් මාසයක දායක මුදල් ඊළඟ මාසයේ අවසන් දිනට ගෙවිය යුතු වුවත් එක් සමාගමක් විසින් පවත්වාගෙන යනු ලබන පෞද්ගලික සේවක අර්ථ සාධක අරමුදල සඳහා විධිමත්ව දායක මුදල් බැර නොකිරීම නිසා 2019 – 2021 කාලයට අදාලව රු.108,218,673ක අධිභාර ගෙවීම පැහැර හැර තිබුණි. | එම සමාගම සහ නියමිත දිනට දායක මුදල් ගෙවීම සිදු නොකරන අනෙකුත් ආයතන සම්බන්ධයෙන් සමූහ පරීක්ෂණ සිදු කර ඒ අනුව හිඟ දායක මුදල් හා අධිභාර ගණනය කිරීමටත් එම මුදල් අය කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමත් සඳහා අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව කාරුණිකව සඳහන් කරමි. | පනතේ විධිවිධාන ප්‍රකාරව මුදල් අයකර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. |
| (ඇ) <u>වෘත්තීය සමිති අංශය</u> | | |
| 1935 අංක 14 වෘත්තීය සමිති ආඥා පනත, 1946 අංක 03 දරන ආඥා පනත, 1948 අංක 15 දරන ආඥා පනත, 1958 අංක 18 දරන ආඥා පනත, 1970 අංක 24 දරන ආඥා පනත යන අණපණත් මගින් වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම, පාලනය සහ ක්‍රියාත්මක වීම, පාලනය සිදුකරගෙන යන අතර, මෙම අණපණත් වර්තමානයට ගැලපෙන ආකාරයට සංශෝධනය කර නොතිබූ බව පරිශීලනයේදී නිරීක්ෂණය විය. මේ පිළිබඳව හඳුනාගත් අංශ කිහිපයක් සංශෝධනය කිරීමට 2019 වර්ෂයේ සිට සාකච්ඡා කර තිබුණද මේ සම්බන්ධව ප්‍රගතියක් නිරීක්ෂණය නොවීය.<br>2289/43 දරණ 2022 ජූලි මස 22 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය අනුව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය යටතේ කාර්ය හා කර්තව්‍ය ලෙස වෘත්තීය සමිති ලියාපදිංචිය, සියලු රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීමට සාධනීය පියවර හඳුන්වාදීම ක්‍රියාත්මක කලයුතු වුවද එවැනි පියවර ගෙන තිබූ බව නිරීක්ෂණය නොවීය. | ඔබ විසින් නිරීක්ෂණය කල කරුණු කෙරෙහි අවධානය යොමුකල බවත්, 2019 වර්ෂයේ සිට වෘත්තීය සමිති ආඥා පනත සම්බන්ධ සංශෝධනයන් දිගින් දිගටම සාකච්ඡා කර ඊට අදාළ සංශෝධන පිළිබඳව වාර්තා නිසි පරිදි අදාල බලධාරීන් වෙත ඉදිරිපත් කර ඇති බවත්, මේ වන විට ගරු ඇමතිතුමාගේ ද අවධානයට යොමුකර පනත සංශෝධනය සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පවතින බවත්, කාරුණිකව දන්වා සිටිමි. | ආඥා පනත් ප්‍රකාරව අරමුණුගත කාර්යයන් සිදු කිරීමට කටයුතු කල යුතුය. |

## 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ 4 වන මහල ආපන ශාලාව සහ 8,9,10,11,12,13 සහ 14 යන මහල්වල අභ්‍යන්තර නිර්මිත හා පාටිෂන් කටයුතු සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත 2021 දෙසැම්බර් 31 දින වන විට රු.460,326,053ක් ගෙවා තිබුණද මෙම වාර්තාවේ දින වන විටත් එම කටයුතු අවසන් වී නොතිබුණි. | 8, 9, 10, 11 සහ 12 යන මහල්වල අභ්‍යන්තර නිර්මිත සකස් කිරීමේ කටයුතු නිම වීමට ආසන්නව පවතී. 13 සහ 14 යන මහල් වල අභ්‍යන්තර නිර්මිත සකස් කිරීමේ කටයුතු අවසන් කර කම්කරු දෙපාර්තමේන්තුව වෙත භාර දී ඇති අතර මේ වනවිට එහි අඩුපාඩු පරීක්ෂා කරමින් පවතී. 16 වන මහල දකුණු පස අභ්‍යන්තර නිර්මිත සකස් කිරීමේ කටයුතු 2023 වර්ෂයේ දී සිදු කිරීමට සැලසුම් කර ඇත. | අභ්‍යන්තර නිර්මිත කටයුතු සිදුකර ඉඩකඩ භාවිතයට පියවර ගත යුතුය. |

## 3.3 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පාඩු හා හානි ලේඛණයට අනුව 2022 වර්ෂයේදී අවස්ථා 02 කදී වාහන අනතුරු සිදුවූ බවට සටහන් කර තිබුණි. අනතුරු සම්බන්ධව මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාර ප්‍රාරම්භක වාර්තා විගණනය වෙත විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2022 වර්ෂයේදී වාහන 02ක් අනතුරට ලක් වූ අතර එම හානි සඳහා වූ අළුත්වැඩියා කටයුතු අවසන් කර පූර්ණ රක්ෂණාවරණය මඟින් වියදම් පියවා ඇත. එම සිදු වූ හානි සම්බන්ධව මු.රෙ 104 පරීක්ෂණ සිදු කිරීම සඳහා අදාළ නිලධාරීන් පත් කර ඇති අතර එම නිලධාරීන් විසින් පරීක්ෂණ වාර්තා සකස් කරමින් පවතී. එම වාර්තාවන් කඩිනමින් සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබයි. | හානි හා පාඩු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කම්කරු දෙපාර්තමේන්තුවට අයත් රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය පිහිටි පැරණි ගොඩනැගිල්ල පස් කඳු | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් යොමු කර ඇති 2023 ජනවාරි 20 දිනැති ලිපිය මගින් එම ආයතනය 2023 අවසන් කාර්තුවේ හෝ | වත්කම් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමණාකරණය කල යුතුය. |

කඩාවැටීමෙන් ජීවිත අවදානම් තත්ත්වයකට මුහුණ දී තිබීම හේතුවෙන් 2015 වර්ෂයේ සිට එම ස්ථානයෙන් ඉවත් වී මසකට රු.175,000ක් බැගින් වූ කුලී ගොඩනැගිල්ලක ස්ථාපිත කර තිබුණි. කුලී ගොඩනැගිල්ලේ ගිවිසුම් කාලය 2021 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වන බැවින් 2021 ජූලි 07 දින රැස්වූ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව මෙම ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ කාර්යය රු.11,177,000ක මුදලකට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙතින් ඉටුකරවා ගැනීමට තීරණය කර තිබුණි. අළුත්වැඩියාව ඇරඹීමට පෙර ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නායයාම් පරීක්ෂණ හා අවදානම් කළමණාකරණ අංශය මගින් 2019 අගෝස්තු 31 දින නිකුත් කරන ලද මූලික සමීක්ෂණ වාර්තාවේ කෙටිකාලීන නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබූ අතර, අළුත්වැඩියාවෙන් පසුවද නැවත 2021 මැයි 17 ආසන්න දිනයකදී ද පස් කඳු කඩා වැටීමක් සිදු වී තිබූ බව දන්වා තිබුණි. මෙම අලුත්වැඩියාවන් නිසි පරිදි කාලීනව සිදුකර නැවත කර්යාලය භාවිතයට ගැනීමට 2023 වර්ෂයේදී ද නොහැකිව පවතින අතර, 2020 ඔක්තෝම්බර් සිට 2022 දෙසැම්බර් දක්වා මසකට රු.280,000 බැගින් බදු කුලී වශයෙන් බාහිර පාර්ශවයකට රු.7,560,000ක මුදලක් ගෙවා තිබුණි. 2024 වර්ෂයේදී නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජිත බවත්, එම ලිපියේ සඳහන් නිර්දේශ වලට යටත්ව ගොඩනැගිල්ල භාවිතා කළ හැකි බවත් සඳහන් කර ඇත. ඒ අනුව මේ වනවිට එම නිර්දේශ ක්‍රියාත්මක කර ඇති අතර සේවක අර්ථසාධක අරමුදල් අංශය විසින් දත්ත පද්ධති සඳහා ජාලගත කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. එම ජාලගත කිරීමේ කටයුතු අවසන් වූ වහාම රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය එම ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීමට නියමිතය.

(ආ) බියගම ආයෝජන ප්‍රවර්ධන කලාපයේ පිහිටුවා ඇති කාන්තා නේවාසිකාගාරය අළුත්වැඩියා කටයුතු සඳහා 2018 ජුනි 15 දින සිට වසා තිබූ අතර, එම අළුත්වැඩියා කටයුතු 2023 වර්ෂය වන විටත් සිදුකර නොතිබුණි. නේවාසිකාගාරය නැවත පිළිසකර නේවාසිකාගාර නඩත්තුව සඳහා වෙන්ව තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන හෙයින් එහි අළුත්වැඩියා කටයුතු සිදුනොකර කොග්ගල සහ කටුනායක නේවාසිකාගාර අළුත්වැඩියා කටයුතු සිදුකිරීමට තිබෙන ප්‍රතිපාදන රු. 4,000,000 යොදාගැනීමට තීරණය කරන ලදී. දැනට බියගම වත්කම් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස කළමණාකරණය කල යුතුය.

| | |
|---|---|
| කිරීම මගින් ආයෝජන කලාපය තුල සේවය කරන පිරිස් වෙත නවාතැන් පහසුකම් සපයාගැනීමේ අවස්ථාව අහිමි වී ඇති අතර, මෙම නේවාසිකාගාරයේ ආරක්ෂාව සඳහා පෞද්ගලික සමාගමක් වෙත 2018 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් දක්වා රු.4,245,678ක මුදලක් වැයකර තිබුණි. | නේවාසිකාගාරය වසා තිබුණද නේවාසිකාගාර ගොඩනැගිල්ලේ ආරක්ෂාව හා නේවාසිකාවන්ගේ සහ ස්ථානභාර නිලධාරීන්ගේ භාවිතය සඳහා ලබාදී ඇති ප්‍රාග්ධන භාණ්ඩවල ආරක්ෂාව වෙනුවෙන් ආරක්ෂක නිලධාරීන්ගේ සේවය ලබාදී ඇත. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

<table>
<tr><th></th><th>විගණන නිරීක්ෂණය</th><th>ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම</th><th>නිර්දේශය</th></tr>
<tr><td>(අ)</td><td>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.
<table>
<tr><th>සේවක වර්ගය</th><th>අනුමත සේවක සංඛ්‍යාව</th><th>තථ්‍ය සේවක සංඛ්‍යාව</th><th>පුරප්පාඩු සංඛ්‍යාව</th></tr>
<tr><td>(i) ජ්‍යෙෂ්ඨ මට්ටම</td><td>211</td><td>133</td><td>78</td></tr>
<tr><td>(ii) තෘතිය මට්ටම</td><td>668</td><td>478</td><td>190</td></tr>
<tr><td>(iii) ද්විතියික මට්ටම</td><td>1,753</td><td>1,718</td><td>35</td></tr>
<tr><td>(iv) ප්‍රාථමික මට්ටම</td><td>489</td><td>401</td><td>88</td></tr>
<tr><td></td><td>-------</td><td>-------</td><td>-----</td></tr>
<tr><td>එකතුව</td><td>3,121</td><td>2,730</td><td>391</td></tr>
<tr><td></td><td>====</td><td>====</td><td>===</td></tr>
</table>
2022 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පවතින සේවක හිඟය, තීරණ ගැනීම, වගකීම භාරගැනීම, අධීක්ෂණය, ක්ෂේත්‍ර රාජකාරි යනාදී අංශයන්හි අපේක්ෂිත කාර්යයසාධනය ළඟා කර ගැනීමට මෙන්ම ඵලදායීතාවය අඩුවීම කෙරෙහිද බලපෑම් සිදුවී ඇති බව නිරීක්ෂණය කෙරේ.</td>
<td>2023 පෙබරවාරි 07 දිනැති අමප/23/0160/605/012 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම දෙපාර්තමේන්තුවට අයත් තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සම්බන්ධයෙන් අනුමැතිය ලැබී ඇත. ඒ අනුව දෙපාර්තමේන්තුමය සහකාර කම්කරු කොමසාරිස් තනතුරෙහි සහ කම්කරු නිලධාරී (සීමිත) තරඟ විභාගය විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වා ප්‍රතිඵල නිකුත් කිරීමට නියමිතව ඇත. රියදුරු සහ කාර්යාල සහායක සේවයේ තනතුරු පුරප්පාඩු බහුකාර්යය සංවර්ධන සහායකයින්ගෙන් සම්පූර්ණ කිරීම සඳහා මේ වනවිට සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇත. ඉංජිනේරු සේවයට හා තාක්ෂණික සේවයට අයත් පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා මේ වනවිට ඉංජිනේරු (සිවිල්) තනතුරු 2 ක් සඳහා නිලධාරීන් 02 නෙක් නම් කර එවා ඇති අතර ඒ සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට යොමු කර ඇත.</td>
<td>අත්‍යවශ්‍ය තනතුරු සඳහා වන කාර්යමණ්ඩල පුරප්පාඩු අනුමත පරිදි පිරවීමට කටයුතු කල යුතුය.</td></tr>
</table>

නීති නිලධාරී තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අදාළව අයදුම්පත් කැඳවීම් නිවේදනය සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.

අනෙකුත් දීපව්‍යාප්ත හා ඒකාබද්ධ සේවා තනතුරු පුරප්පාඩු පිළිබඳව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ඇත.